සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2024 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

2024-02-17
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, හිඟකම යන සංකල්පය නිවැරදිව විස්තර කරන ලබන ප්‍රකාශය කුමක් ද?

(1) හිඟකම යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා ඇති සම්පත්වල විකල්ප භාවිතය වේ.

(2) හිඟකම යනු අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සම්පත්වල ඇති සීමිත බව වේ.

(3) හිඟකම යනු පුද්ගලයෙකු විසින් භාණ්ඩයක් පරිභෝජනයෙන් ලබාගන්නා මුළු තෘප්තිය වේ.

(4) හිඟකම යනු සමාන තෘප්තියක් ලබාදෙන භාණ්ඩ දෙකක වෙනස් සංයෝජනයකි.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, සාර්ව ආර්ථික විද්‍යාව (macro-economics) මඟින් ආවරණය වන ක්ෂේත්‍රයක් **නොවන්නේ** කුමක් ද?

(1) මිල මට්ටම. (2) ආර්ථික වර්ධනය.

(3) සමස්ත නිමැවුම. (4) වෙළෙඳපොළ තුළ පාරිභෝගික හැසිරීම.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, “සැපයුම වෙනස්වීම” සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?


(1) භාණ්ඩයේ මිල වෙනස් වන අතර, සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව පවතී.

(2) භාණ්ඩයේ මිල වෙනස් වන අතර, සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ද වෙනස් වේ.

(3) භාණ්ඩයේ මිල ස්ථාවරව පවතින අතර, සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක වෙනස් වේ.

(4) භාණ්ඩයේ මිල ස්ථාවරව පවතින අතර, සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ද වෙනස් නොවේ.

1.4 පහත සඳහන් රූප සටහන මගින් රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පෙන්නුම් කෙරේ:




ඉහත වක්‍රයේ $x$ ලක්ෂ්‍යය මගින් නිරූපණය වන්නෙ:

(1) පූර්ණ සේවා නියුක්තියයි. (2) සම්පත් ඌන උපයෝජනයයි (under-utilization).

(3) ආර්ථික වර්ධනයයි. (4) සේවා වියුක්තියයි.

1.5 පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** පුද්ගලයෙකු ලබන උපයෝගිතා මට්ටම සැසඳිය නොහැකි බවට ක්‍රම සූචක උපයෝගිතා න්‍යාය මගින් උපකල්පනය කෙරේ.

**(b)** සංඛ්‍යා සූචක උපයෝගිතා න්‍යායට අනුව තෘප්තිය මැනිය නොහැකිය.

**(c)** ආන්තික උපයෝගිතාවය යනු අමතර භාණ්ඩ ඒකකයක් පරිභෝජනය කිරීමෙන් පුද්ගලයෙකු ලබන අමතර තෘප්තියයි.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, උපයෝගිතා න්‍යාය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වන්නේ:

(1) **(a)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(c)** පමණි. (4) **(a)** සහ **(c)** පමණි.

1.6 භාණ්ඩයක මිල රු.12/- සිට රු.10/- දක්වා අඩු වන විට, එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ඒකක 900 සිට 1,000 දක්වා ඉහළ යයි. භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය:


(1) අනම්‍ය වේ. (2) නම්‍ය වේ. (3) ඒකීය නම්‍ය වේ. (4) පූර්ණ නම්‍ය වේ.

1.7 2022 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවට අනුව, 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වූයේ:

(1) ඇමරිකානු ඩොලර් ($) 2,000. (2) ඇමරිකානු ඩොලර් ($) 3,474.

(3) ඇමරිකානු ඩොලර් ($) 2,600. (4) ඇමරිකානු ඩොලර් ($) 5,574.

1.8 X නිෂ්පාදිතයට අදාලව පහත සඳහන් ප්‍රස්තාරය ඔබ වෙත සපයා ඇත:




පාරිභෝගික අතිරික්තය වනුයේ:

(1) රු.1,250/-. (2) රු.500/-. (3) රු.1,750/-. (4) රු.750/-.

1.9 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන්, පූර්ණ තරඟකාරී ආයතනයක් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) සාමාන්‍ය පිරිවැයට වඩා මිල වැඩි නම්, ආයතනය ප්‍රාමාණික ලාභ ලබයි.

(2) සාමාන්‍ය පිරිවැයට වඩා මිල අඩු නම්, ආයතනය ප්‍රාමාණික ලාභ ලබයි.

(3) මිල, සාමාන්‍ය පිරිවැයට සමාන නම්, ආයතනය ප්‍රාමාණික ලාභ ලබයි.

(4) මිල, සාමාන්‍ය පිරිවැයට සමාන නම්, ආයතනය අසාමාන්‍ය ලාභ ලබයි.

1.10 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක උපකරණයක් වන්නේ කුමක් ද?

(1) බැංකු පොලී අනුපාතය. (2) ණය සඳහා වන ඇප සුරැකුම් මත සීමා පැනවීම.

(3) විවෘත වෙළෙඳපොළ කටයුතු. (4) සංචිත අනුපාතය.

*අංක 1.11 සහ 1.12 ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.11 …………… *(පූර්ණ තරඟකාරී / ඒකාධිකාරී)* ආයතනයක් වෙළෙඳපොළේ මිල තනන්නෙකු (price maker) ලෙස ක්‍රියා කරයි.

1.12 යෙදවුමේ සමානුපාතික වැඩිවීම, නිමැවුමේ සමානුපාතික වැඩිවීමට වඩා අඩු නම්, …………… *(වැඩිවන / අඩුවන)* පරිමාණානුකූල ඵල ඇති වේ.

*අංක 1.13 සහ 1.14 ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.13 රජය විසින් නිෂ්පාදකයින් මත ඒකක බද්දක් පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.

1.14 නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන සියලුම යෙදවුම් සාධක දිගු කාලයේදී විචල්‍ය වේ.

*අංක 1.15 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.15 "ආර්ථික වර්ධනය" යන පදය කෙටියෙන් පැහැදිලි කරන්න.

1.16 ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳපොළක ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

1.17 වාණිජ බැංකුවක කාර්යයන් දෙකක්(02) සඳහන් කරන්න.

1.18 "සැපයුම් නීතිය" කෙටියෙන් පැහැදිලි කරන්න.

1.19 සැපයුම් මිල නම්‍යතාවය තීරණය කරන සාධක දෙකක්(02) සඳහන් කරන්න.

1.20 ආර්ථික සංවර්ධනයක් තිබෙන විට ඇතිවන ගුණාත්මක වෙනස්කම් දෙකක්(02) හඳුනා දක්වන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) නිෂ්පාදන සාධක (ආර්ථික සම්පත්) හතර(04) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) ආවස්ථික පිරිවැය ශුන්‍ය වන අවස්ථා දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(c) ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත සඳහන් ඉල්ලුම් ශ්‍රිතය ($Q_d$) සහ සැපයුම් ශ්‍රිතය ($Q_s$) ඔබ වෙත ලබා දී ඇත:

$$Qd = 200 - 3p$$

$$Qs = -100 + 2p$$

**ඔබ විසින් කළ යුතු දෑ:**

භාණ්ඩයේ වෙළෙඳපොළ සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) කෙටිකාලයේදී නිෂ්පාදන ක්‍රියාවලියට අදාළව පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත:

| ස්ථාවර සාධකය-ඉඩම (අක්කර) | විචල්‍ය සාධකය (ශ්‍රමය) | මුළු නිෂ්පාදිතය [Total Product (TP)] (ඒකක) |
|---|---|---|
| 1 | 0 | 0 |
| 1 | 1 | 8 |
| 1 | 2 | 18 |
| 1 | 3 | 33 |
| 1 | 4 | 36 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) ඉහත සඳහන් තොරතුරු භාවිතයෙන්, සාමාන්‍ය නිෂ්පාදිතය [Average Product (AP)] සහ ආන්තික නිෂ්පාදිතය [Marginal Product (MP)] ඒකකවලින් **ගණනය කරන්න**. (ලකුණු 04)

(ii) කෙටි කාලයේදී මුළු නිෂ්පාදිතයෙ [Total Product (TP) ], සාමාන්‍ය නිෂ්පාදිතයෙ [Average Product (AP)] සහ ආන්තික නිෂ්පාදිතයේ [Marginal Product (MP)] හැසිරීම **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(a) මුදල් ඉල්ලුම සඳහා බලපාන සාර්ව ආර්ථික (macro-economic) විචල්‍යයන් තුනක්(03) **හඳුනා දක්වන්න**.(ලකුණු 03)

(b) මිල මට්ටම සහ පොලී අනුපාතය අතර ඇති සම්බන්ධතාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) උද්ධමනය ඇතිවීමට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ලද වෙළෙඳ සම්බාධකවල (trade barriers) බලපෑම් දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) රටක මුදලේ ක්ෂයවීමේ අවාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) ආර්ජන්ටිනාව සහ චීනය, ඉරිඟු සහ සහල් යන දෙවර්ගයම නිෂ්පාදනය කරයි. රටවල් දෙකෙහිම එක් ශ්‍රම ඒකකයකින් නිෂ්පාදනය කළ හැකි ඉරිඟු සහ සහල් ඒකක ගණන පහත වගුවෙන් පෙන්නුම් කෙරේ:

| රට | ඉරිඟු (කිලෝග්‍රෑම්) | සහල් (කිලෝග්‍රෑම්) |
|---|---|---|
| ආර්ජන්ටිනාව | 24 | 12 |
| චීනය | 4 | 8 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

එක් එක් භාණ්ඩය නිෂ්පාදනයේදී සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටට ද යන්න **පැහැදිලි කරන්න** *(ඔබගේ උත්තරය ගණනය කිරීම් සමඟ තහවුරු කරන්න).* (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

(A) (a) ජාතික ආදායම් ගිණුම්වල පවතින සීමා (limitations) තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(b) ජාතික ආදායම් ගිණුම්කරණයේ "ගැනුම්කරුවන්ගේ මිල (Purchasers' Price)" යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(B) කිසියම් ආර්ථිකයක වසරක කාලයක් සඳහා ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත ලබාදී ඇත:

| | **රු. මිලියන** |
|---|---:|
| පෞද්ගලික පරිභෝජන වියදම | 2,000 |
| රජයේ පරිභෝජන වියදම | 6,500 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 2,500 |
| තොග වෙනස්වීම් | 2,700 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 7,600 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 9,900 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | 500 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 05)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(C) රජයේ මෑත කාලීන බදු පැනවීම්, ශ්‍රී ලංකාවේ පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට බලපාන ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |